1st Place Winner
National Productivity
Award 2020

SLSI
SYSTEM CERTIFIED ISO 9001

SLAB ACCREDITED
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/06/ANN.TR/2025(82) | ඔබේ අංකය<br>உமது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2025.09.10 |

ආණ්ඩුකාර ලේකම්, සභා ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>වාර්ෂික ස්ථාන මාරු - 2025</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ ඇමතූ මාගේ අංක CSS/03/06/ANN.TR/2025(80) හා 2025.08.26 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, මා විසින් 2025.02.05 දිනැති ව නිකුත් කරන ලද ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 01/2025 හි අංක 09 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාර ව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කර ඇති නිලධාරීන්ගේ නාම ලේඛනය මේ සමඟ යොමු කර ඇති අතර ඒ අනුව එම නිලධාරීන් හා ඔවුන් සමඟ ගැලපීම් කර ඇති අනෙකුත් නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු නියෝග දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩල තීරණ නිකුත් කරන තෙක් තාවකාලික ව අත්හිටවනු ලබන බව කාරුණික ව දන්වා සිටිමි.

- **ඇමුණුම 01 - දකුණු පළාත් සංවර්ධන නිලධාරී සේවය**
- **ඇමුණුම 02 - කළමනාකරණ සේවා නිලධාරී සේවය**
- **ඇමුණුම 03 - පළාත් රියදුරු සේවය**
- **ඇමුණුම 04 - කාර්යාල සේවක සේවය**

03. ඒ අනුව, 2025 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන මණ්ඩල තීරණ මඟින් අවලංගු කරන ලද ස්ථාන මාරුවීම් හා ඉහත ඇමුණුම් 01 සිට 04 දක්වා වූ ලේඛනවල නම් සඳහන් නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් හැර අනෙකුත් සියලු ස්ථාන මාරුවීම් **2025.09.15 දිනට ක්‍රියාත්මක කරන ලෙස මෙයින් නියෝග කරමි.**

04. තවද වාර්ෂික ස්ථාන මාරු තීරණ / සමාලෝචන (අභියාචනා) තීරණ දැනුම්දීමේ ලේඛන වල ක්‍රියාත්මක වන දිනය ලෙස වෙනත් දිනයක් සඳහන් කර ඇති ස්ථාන මාරු අදාළ දිනයට ක්‍රියාත්මක කළ යුතුය.

අ.පි.බ.

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රධාන ලේකම්<br>பிரதான செயலாளர்<br>Chief Secretary | 091 4944002 | කාර්යාලය<br>காரியாலயம்<br>Office | 091 4119011<br>091 2234052 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax |
| 091 2246299 | විද්‍යුත් තැපෑල<br>மின் அஞ்சல்<br>E-mail | chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Web site | www.cs.sp.gov.lk |

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

05. එසේම, ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වන දින වන විට ප්‍රසූත නිවාඩු ලබා ඇති නිලධාරිනියන්ගේ ස්ථාන මාරුවීම් **<u>ප්‍රසූත නිවාඩු අවසන්ව පැමිණි දිනට සති 02 කට පසු</u>** ක්‍රියාත්මක කළ යුතු අතර, එවැනි වාර්ෂික ස්ථාන මාරු ගැලපුම්වලට සම්බන්ධ නිලධාරීන් සිය ආයතනවලින් නිදහස් කිරීම තාවකාලික ව නතර කරනු පිණිස ඒ පිළිබඳ ව අදාළ වාර්ෂික ස්ථාන ගැලපුමෙහි සිටින අනෙකුත් නිලධාරීන්ගේ ආයතන ප්‍රධානීන් අප්‍රමාදීව දැනුවත් කිරීමට ප්‍රසූත නිවාඩු ලබා ඇති නිලධාරිනියගේ ආයතන ප්‍රධානියා විසින් කටයුතු කළ යුතුය.

06. දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩල තීරණ ලද වහාම ඒ පිළිබඳ තොරතුරු දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයීය නිල වෙබ් අඩවියෙහි (www.cs.sp.gov.lk) පළ කිරීමට කටයුතු කරන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

**සුමිත් අලහකෝන්**
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

<u>පිටපත් :</u>

01. ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, දකුණු පළාත. - දැ.ගැ.ස.
02. ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත. - දැ.ගැ.ස / අ.ක.ස.
03. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, ජාතික විගණන උප කාර්යාලය, ගාල්ල - දැ.ගැ.ස.
04. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස / අ.ක.ස.